# 2014 ජගත් පරිසර දිනයට තේමා වූ සංවර්ධනය වෙමින් පවත්නා කුඩා දිවයින් රාජ්‍යයන් (Small Island Developing States)

**සුරණි පතිරණ**

**පරිසර කළමනාකරණ නිලධාරී, දේශගුණ විපර්යාස ලේකම් කාර්යාලය**

**පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය**

විසි එක්වන සියවසේ සමස්ත ලෝක වාසීන් මුහුණ දෙන ප්‍රධාන සංවර්ධන අභියෝගයක් ලෙස දේශගුණ විපර්යාස හඳුනා ගෙන ඇත. ගෝලීය උණුසුම් වීම නිසා සිදුවන මෙම දේශගුණ විපර්යාස, මානව ක්‍රියාකාරකම් හේතුකොට ගෙන හරිතාගාර වායු ඉතා අධික ලෙස වායුගෝලයට එක්වීමේ සෘජු ප්‍රතිඵලයක් මත සිදුවන බවත්, විශේෂයෙන්ම පොසිල ඉන්ධන දහනය මෙයට වැඩි වශයෙන් දායක වන බවත් දේශගුණ විපර්යාස පිළිබඳ අන්තර් රාජ්‍ය මණ්ඩලය (IPCC) මගින් තහවුරු කර ඇත. අධිපරිභෝජන ජීවන රටාවකට හිමිකම්පාන දියුණුයැයි පවසන රටවල් බොහොමයක් වැඩි වශයෙන් හරිතාගාර වායු වායුගෝලයට මුදා හැරීමට දායක වී ඇති බව ප්‍රසිද්ධ කරුණක් වේ. සංවර්ධිත රටවල් හා සැසඳීමේදී සංවර්ධනය වෙමින් පවතින රටවල් වායුගෝලයට හරිතාගාර වායු විමෝචනය අවම වුවද එහි ප්‍රතිවිපාක ගෝලීය ලෙස ලොව සියලුම ජාතීන්ට අත්විඳීමට සිදු වී ඇත. විශේෂයෙන්ම සංවර්ධනය වෙමින් පවත්නා රටවලට දේශගුණ විපර්යාස සඳහා අනුහුරු වීමට ඇති හැකියාව අඩු නිසාම එම රටවල් දැඩි ලෙස අවධානමට ලක්ව ඇත. ඒ අතරින් සංවර්ධනය වෙමින් පවත්නා කුඩා දිවයින් රාජ්‍ය දේශගුණ විපර්යාස හමුවේ වඩාත් අවධානමට ලක් වී ඇති බව හඳුනාගෙන ඇත.

1992 ජූනි මස පැවති එක්සත් ජාතීන්ගේ පරිසර සහ සංවර්ධන සමුළුවේදී (United Nations Conference on Environment and Development- Earth Summit) සංවර්ධනය වෙමින් පවත්නා කුඩා දිවයින් රාජ්‍යයන්ට අයත් කණ්ඩායම බිහිවූ අතර මෙම කණ්ඩායම ජාත්‍යන්තර සහයෝගීතා සංවිධානයක් වේ. ගෝලීය හරිතාගාර වායු විමෝචනයට අවම වශයෙන් දායකත්වයක් දක්වන එහෙත් දේශගුණ විපර්යාසයන් නිසා වඩාත් පීඩාවට පත්වන වෙරළාශ්‍රිත පහත්බිම් රටවල් මෙම කණ්ඩායමට ඇතුලත් වේ. තවද මෙම රටවල්, දේශීය, කලාපීය සහ ගෝලීය වශයෙන් ස්වභාවික පරිසරයේ සිදුවන ක්ෂණික වෙනස්වීම් වලට සංවේදී සහ පහසුවෙන් ගොදුරුවන දිවයින් ලෙස ද හඳුනා ගෙන ඇත.

1994 දී බාබඩෝස් හිදී සංවර්ධනය වෙමින් පවත්නා කුඩා දිවයින් රාජ්‍යයන්ගේ තිරසාර සංවර්ධනය පිළිබඳ ගෝලීය සම්මේලනය පැවති අතර එහිදී සංවර්ධනය වෙමින් පවත්නා කුඩා දිවයින් රාජ්‍යයන් සඳහා බාබඩෝස් ක්‍රියාකාරී සැලැස්ම ප්‍රකාශයට පත් කර ඇත. න්‍යායපත්‍ර 21 මගින් පිළිගෙන තිබූ කුඩා දිවයින් රාජ්‍ය මුහුණ පා ඇති අභියෝග, සංවර්ධනය වෙමින් පවත්නා කුඩා දිවයින් රාජ්‍යයන්ගේ තිරසාර සංවර්ධනය පිළිබඳ ගෝලීය සම්මේලනය (The Global Conference on the Sustainable Development of Small Island Developing States) මගින් තවදුරටත් සනාථ කර සිටී. දේශගුණ විපර්යාස, ස්වභාවික ආපදා, අන්තර්ජාතික වෙළඳ බලපෑම, සම්පත් සීමිත වීම, ජනගහන වර්ධනය, දුර්වල ආර්ථිකය (කෘෂිකර්මය පදනම් වූ), වෙරළාශ්‍රිත පහත්බිම් කරා මානව ක්‍රියාකාරකම් කේන්ද්‍රගත වීම ආදී වශයෙන් දිවයින් රාජ්‍ය මුහුණ දී ඇති අභියෝග ප්‍රභේද කිහිපයකට කැටිකොට දක්වා ඇත.

වර්තමානය වන විට එක්සත් ජාතීන්ගේ ආර්ථික හා සමාජ කටයුතු දෙපාර්තමේන්තුව සංවර්ධනය වෙමින් පවතින කුඩා දිවයින් රාජ්‍ය 52 ක් හඳුනා ගෙන ඇති අතර, එම රාජ්‍ය කැරිබියන්, පැසිපික් සහ අප්‍රිකා, ඉන්දීය සාගර, මධ්‍යධරණී හා දකුණු චීන

මුහුද ලෙස භූගෝලීය කලාප 3 කට වර්ග කර ඇත. පිළිවෙලින් කුඩා දිවයින් රාජ්‍ය 23 ක්, 20 ක් සහ 09ක් වශයෙන් කැරිබියන්, පැසිපික් සහ අප්‍රිකා, ඉන්දීය සාගර, මධ්‍යධරණී හා දකුණු චීන මුහුද යන කලාප තුනට ඇතුලත් වේ. සංවර්ධනය වෙමින් පවතින කුඩා දිවයින් රාජ්‍ය කෙරෙහි අන්තර්ජාතික ප්‍රජාවගේ පිළිගැනීම සහ අවධානය ලැබී ඇති අතර දේශගුණ විපර්යාස ආශ්‍රිත ගැටලු නිරාකරණය කරගැනීම සඳහා ප්‍රමාණවත් සම්පත් ඔවුන් වෙත ලැබෙමින් පවතී. මේ නිසා සංවර්ධනය වෙමින් පවත්නා කුඩා දිවයින් රාජ්‍ය සිය අරමුණු කරා ළගාවීම කෙරෙහි බොහෝ පියවර ගෙන ඇති බව පෙනී යයි.

තවදුරටත් මෙම කුඩා දිවයින් රාජ්‍ය කෙරෙහි ලෝක ප්‍රජාවගේ අවධානය යොමු කරන වස්, එක්සත් ජාතීන්ගේ මහා සම්මේලනය මගින් (United Nations General Assembly) සංවර්ධනය වෙමින් පවත්නා කුඩා දිවයින් රාජ්‍යයන්ගේ ජාත්‍යන්තර වසර ලෙස 2014 වසර ප්‍රකාශයට පත්කර ඇත. තවද සෑම වසරකම ලෝක පරිසර දින තේමාව ප්‍රකාශයට පත්කරන, එක්සත් ජාතීන්ගේ පරිසර වැඩසටහන මෙවර කුඩා දිවයින් රාජ්‍යයන්ට අනන්‍ය වූ සංවර්ධන අභියෝග හා ඔවුන් මුහුණ දෙන දේශගුණ විපර්යාස, අපද්‍රව්‍ය කළමනාකරණය, තිරසර නොවූ පරිභෝජනය, ස්වභාවික සම්පත් හායනය සහ ආන්තික වූ ස්වභාවික ආපදා ඇතුළු විවිධ වූ පාරිසරික ගැටළු පිළිබඳ ව දැනුවත් කිරීමේ අරමුණින් කුඩා දිවයින් රාජ්‍ය තේමාව කරගනිමින් ජූනි 05 දිනට යෙදී ඇති ලෝක පරිසර දිනය සැමරීමට ලෝක ප්‍රජාවට ඇරයුම් කර සිටී.

කුඩා දිවයින් රාජ්‍යයන්ගේ වැදගත්කම පිළිබඳව සහ විශේෂයෙන්ම දේශගුණ විපර්යාස හේතුවෙන් එම දිවයින් මුහුණ දෙන අවධානමෙන් ආරක්ෂා කර රැක ගැනීම සඳහා උදවු කිරීමේ අවශ්‍යතාව පිළිබඳ ලෝක ප්‍රජාවට අවබෝධයක් ලබාදීම සහ එම දිවයින් කෙරෙහි අවධානයක් යොමු කිරීමට මෙවර ලෝක පරිසර දිනයෙන් අපේක්ෂා කෙරේ. මෙම කුඩා දිවයින් සමඟ සාමූහිකත්වයක් ගොඩනැගීමට මෙවර පරිසර දිනය අනර්ඝ අවස්ථාවක් වේ යැයි ලෝක පරිසර සංවිධානය තවදුරටත් විශ්වාස කරයි